**අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය - 2022**

-----------------------------------------------------------------

අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ (AIUDP) 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හා සංවර්ධනය සඳහා වන ප්‍රංශ නියෝජිතායතනය අතර 2016 දෙසැම්බර් 01 දින එළඹි (2017 අගෝස්තු 31, 2018 මැයි 14 හා 2021 මාර්තු 14 යන දිනයන්ගෙන් සංශෝධිත) CLK – 100901 R අංක දරන ණය ගිවිසුමේ 3.4.3 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘතියේ කාල සීමාව

ණය පහසුකම් ගිවිසුම අනුව, නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය (AIUDP) ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. අනුරාධපුර නගරයේ පූජනීය සහ නූතන කොටස අතර සමතුලිත සම-සංවර්ධන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම වන අතර, එහි සංස්කෘතික හා ජාතික උරුමයන් ආරක්ෂා කිරීම හා මෙය ප්‍රධාන ආකර්ශනීය ස්ථානයක් බවට පත්කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 10,025.18 කට සමාන යූරෝ මිලියන 62.4 ක් වන අතර ඉන් රු.මිලියන 8,354.32 කට සමාන යූරෝ මිලියන 52ක් සැපයීමට සංවර්ධනය සඳහා වන ප්‍රංශ නියෝජිතායතනය (AFD) එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 1,670.86 ක මුදල ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට බලාපොරොත්තු වේ. ව්‍යාපෘතියේ කටයුතු 2016 දෙසැම්බර් 01 දින ආරම්භ කරන ලද අතර, 2021 දෙසැම්බර් 31 දින වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, සංශෝධිත ගිවිසුමට අනුව ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දිනය 2023 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කර තිබුණි.

### 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය යන කොටස් විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, 2022 දෙසැම්බර් 31 දිනට අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිනුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව/ විගණන නිරීක්ෂණය | මුදල රු. මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 21 හි 23 (අ) වගන්තියට අනුව, ව්‍යාපෘතියේ විදේශ ණය සම්බන්ධ විනිමය ගැලපීම් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි. | 702 | ගිණුම් සැකසීමේදී, අපි ණය දෙන්නාගේ බැංකු ගිණුම් සහ TOD සමඟ අපගේ ශේෂයන් සසඳා ඇත. | විනිමය ගැලපීම් ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුය. |
| ආ) | 2022 දෙසැම්බර් 31 දින දක්වා ව්‍යාපෘති 03කට අදාළව කරන ලද වැඩ වටිනාකම උපචිත පදනමට ගිණුම්ගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස කළ | 165.36 | ඉහත සඳහන් මුදල 2022 දෙසැම්බර් 31 වන දින වන විට ඉංජිනේරුවරයා විසින් සහතික කර නොමැත. | මූල්‍ය ප්‍රකාශනයේ නිවැරදි අගය දැක්විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | වැඩවල වටිනාකම සහ කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු මුදල එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | | | |
| ඇ) | 2022 දෙසැම්බර් 31 දිනට වැඩබිමෙහි ඇති ද්‍රව්‍ය සඳහා අත්තිකාරම් ගෙවීම ජංගම වත්කම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ කෙරීගෙන යන වැඩ ගිණුම එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 10.63 | අපි වැඩබිමෙහි ඇති ද්‍රව්‍ය සඳහා ගෙවීම් කිරීමේදී වියදම් ගිණුමේ ගිණුම්ගත කරනු ලැබේ. එයට හෙතුව වන්නේ මෙය කෙටි කාලයක් තුළ භාවිතා කරන නිසාත් එය ඊළඟ අතරමැදි ගෙවීම් සහතිකයේදී (IPC) ගිණුම්ගත වන නිසාත්ය. | මූල්‍ය ප්‍රකාශනයේ නිවැරදි අගය දැක්විය යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිලිබඳ භෞතික ප්‍රගතිය**

| සංරචකය | ක්‍රියාකාරකම | 2022 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත භෞතික කාර්යසාධනය ප්‍රතිශතය | 2022 දෙසැම්බර් 31 දිනට ළඟා කරගෙන ඇති කාර්යසාධනය ප්‍රතිශතය | ප්‍රමාදය/ විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|
| 01 | තිරසර නාගරික සංවර්ධනය | | | | |
| | පැකේජය 03 | 100 | 85 | සමාලෝචිත වර්ෂය තුළ රුපියල් මිලියන 2,123.19 ක වටිනාකමකින් යුත් පැකේජ 05 ක් ආරම්භ කර තිබුණු අතර 2022 දෙසැම්බර් 31 වන විට පැකේජ 2 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි. කෙසේ වෙතත්, සම්පූර්ණ නොකළ අංක 3 සහ 4 පැකේජවලට අදාළ ප්‍රමාද කාලය මාස 04 සිට 07 දක්වා පරාසයක පැවතුන අතර, එය ව්‍යාපෘතියේ වියදම වැඩිවීමට බලපෑ හැකි වන අතර මෙම ප්‍රමාදයට ප්‍රසම්පාදනයේ ප්‍රමාදය හා දුර්වල කොන්ත්‍රාත් අධීක්ෂණයද ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. | දුර්වල කොන්ත්‍රාත් අධීක්ෂණය |
| | පැකේජය 04 | 100 | 90 | | |

| | |
|---|---|
| **කළමනාකරණයේ ප්‍රතිචාරය** | උප ව්‍යාපෘති ප්‍රමාද වීමට ප්‍රධාන හේතුව වූයේ COVID 19 බලපෑම සහ රට මුහුණ දී ඇති මූල්‍ය අර්බුදයයි. කෙසේ වෙතත්, පිරිවැය කොන්ත්‍රාත්තුවේ වටිනාකම ඉක්මවා නොයනු ඇති බවට අපේක්ෂා කෙරේ. |
| **විගණකගේ නිර්දේශයන්** | කාල රාමුව තුළ නිම කිරීම සඳහා ඉදිකිරීම් කටයුතු සමීපව නිරීක්ෂණය කළ යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| අ) | ණය මුදලින් සියයට 62 ක් වූ රුපියල් මිලියන 5,025 ක් වටිනා පැකේජ 07 ක් වසර 07 ක් ගතවී තිබුණද 2022 දෙසැම්බර් 31 දක්වාම ප්‍රදානය කර නොතිබුණි. තවද, ව්‍යාපෘති කාල සීමාව තුළ එම ව්‍යාපෘතිවලින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වී ඇති බවද නිරීක්ෂණය විය. | 2022 මැද භාගයේදී මුහුණ දුන් මූල්‍ය අර්බුදය හේතුවෙන් සහ ඉතිරි කටයුතු කරගෙන නොයන ලෙසට AFD මගින් උපදෙස් දීම හේතුවෙන් 2022 වර්ෂය තුළ පැකේජ 7ක් ප්‍රදානය කළ නොහැකි විය. | ඉතිරි වැඩ කඩිනම් කිරීමට නිවැරදි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| ආ) | සමාලෝචිත වර්ෂය තුළ කොන්ත්‍රාත්තු 04ක් අවසන් කර තිබුණද, අවසන් කරන ලද ව්‍යාපෘති සම්බන්ධයෙන් වැඩ නිම කිරීමේ සහතිකය මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | අවසාන ගෙවීම සමඟ, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකය විසින් ව්‍යාපෘති සම්පූර්ණ කිරීමේ වාර්තාව සහ ව්‍යාපෘති භාරදීමේ හා භාරගැනීමේ වාර්තාව ලබා දෙනු ඇත. | වැඩ නිම කිරීමෙන් පසු වැඩ නිම කිරීමේ සහතිකය නිකුත් කළ යුතුය. |
| ඇ) | දක්ෂිණ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය සංවර්ධනය කිරීමේ කොන්ත්‍රාත්තුව 2022 පෙබරවාරි 01 වන දින රු.මිලියන 1,176 කට ලබා දී ඇති අතර 2023 සැප්තැම්බර් 01 දින ව්‍යාපෘතිය නිම කිරීමට අපේක්ෂිතව තිබුණි. 2022 දෙසැම්බර් 31 වන විට ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 243.15 ක් වැය කර තිබුණද, අරමුදල් හිඟය හේතුවෙන් ඉදිකිරීම් කටයුතු අත්හිටුවා තිබුණි. | රට මුහුණ දී ඇති මූල්‍ය අර්බුදය සහ ණය සපයන ආයතනය ණය මුදල අත්හිටුවීම හේතුවෙන් ව්‍යාපෘතිය සැලසුම් ප්‍රකාරව කරගෙන යාමට නොහැකි විය. | ඉතිරි වැඩ කටයුතු නියමිත වේලාවට ඉටු කිරීම කඩිනම් කිරීමට කටයුතු කළ යුතුයි. |

## 3.3 අරමුදල් උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘතිය 2016 වර්ෂයේ ආරම්භ කර ඇති අතර 2022 දෙසැම්බර් 31 දක්වා එකඟ වූ රු.මිලියන 10,025 ණය මුදලින් රු.මිලියන 2,164 (සියයට 21) පමණක් උපයෝජනය කර තිබූ අතර සවිස්තරාත්මක නිර්මාණය ඉදිරිපත් කිරීමට වසර 07ක කාලයක් ප්‍රමාද වීම එම අහිතකර තත්ත්වය සඳහා බලපා තිබුණි. | එකඟ වේ. | ණය මුදල ඵලදායී ලෙස භාවිතා කළ යුතුය. |

## 3.4 කළමනාකරණ අකාර්යක්ෂමතා

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| අ) | 7 වැනි පැකේජය වන උතුරු බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරීම යටතේ වාරිමාර්ග නිල නිවාස ගොඩනැගිල්ල වෙනත් ස්ථානයකට ගෙන ඒම සඳහා වන්දි වශයෙන් රු.මිලියන 45 | මෙම අත්පත් කරගත් ඉඩම අනුරාධපුර මහ නගර සභාව සහ නාගරික සංවර්ධන අධිකාරිය විසින් අනාගත සංවර්ධනය සඳහා | වන්දි මුදල පියවීමට කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | ක මුදලක් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණි. කෙසේ වෙතත්, මෙම පැකේජය අවලංගු කිරීමට තීරණය කර තිබූ අතර 2023 මැයි 31 වන දින දක්වාම වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ගෙවූ ඒම මුදල නැවත අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | භාවිතා කරනු ඇති අතර එබැවින් මෙම ඉඩම් අත්පත් කර ගැනීම අපතේ නොයනු ඇත. | |
| ආ) | ව්‍යාපෘති මෙහෙයුම්වල ප්‍රතිදානය සහ නිමවුම මැනීම සඳහා ප්‍රධාන කාර්යසාධන ස්ථාපිත කර නොතිබුණි. | ප්‍රතිඵල රාමුව (RF) ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI) පිහිටුවීම සඳහා AFD විසින් වලංගු කර නොමැත. | "SMART" KPI's හඳුන්වා දිය යුතුවේ. |
| ඇ) | ණය පහසුකම් ගිවිසුමට අනුව ව්‍යාපෘතිය 2021 වසර අවසන් වන විට රු.මිලියන 6,562.68 ක වටිනාකමකින් යුත් පැකේජ 12 ක ප්‍රසම්පාදනය අවසන් කර තිබිය යුතු විය. කෙසේ වෙතත්, රු.මිලියන 5,025 ක් වටිනා පැකේජ 07 ක ප්‍රසම්පාදනය 2023 මැයි 31 වන දින දක්වාම ආරම්භ කර නොතිබුණි. තවද, ණය පහසුකම 2023 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කර තිබූ අතර, ව්‍යාපෘති කාල සීමාව තුළ නිම කිරීමට අපේක්ෂිතව තිබූ වැඩ, ව්‍යාපෘතිය අවසාන වන විට සම්පූර්ණයෙන් නිම කිරීමට නොහැකි වන බව තවදුරටත් නිරීක්ෂණය විය. | රට මුහුණ දී ඇති මූල්‍ය අර්බුදය හේතුවෙන් ව්‍යාපෘතියට 2022 අප්‍රේල් මාසයෙන් පසු ඔවුන්ගේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට නොහැකි වූ අතර මේ වන විට භාණ්ඩාගාරය අරමුදල් සපයන්නා සමඟ සාකච්ඡා කිරීමෙන් පසු අඩු මට්ටමින් දිගටම කරගෙන යාමට ව්‍යාපෘතිය ඇගයීමට ලක් කරමින් පවතී. | ව්‍යාපෘතියට අමතර වියදමකින් තොරව වැඩ සැලැස්මට අනුව වැඩ නිම කිරීමට කටයුතු කළ යුතුය. |
| ඈ) | 2022 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ සේවක සංඛ්‍යාව අඩු කර ඇති බැවින් දීර්ඝ කරන ලද ව්‍යාපෘති කාල සීමාව තුළ ව්‍යාපෘතියේ ඉතිරි වැඩ නිම කිරීමේ හැකියාව විගණනයට සැක සහිත වේ. | එකගවේ. | අවශ්‍ය ව්‍යාපෘති කාර්ය මණ්ඩලය නඩත්තු කළ යුතුය. |
| ඉ) | වත්කම් හිමිකරුවන්ට පවරා දුන් ව්‍යාපෘති වත්කම්වල දිගුකාලීන තිරසාරභාවය සඳහා නිශ්චිත වත්කම් කළමනාකරණ සැලැස්මක් ව්‍යාපෘතිය විසින් සකස් කර නොතිබුණි. | එක් එක් උප ව්‍යාපෘතිය සඳහා වන වත්කම් කළමනාකරණ සැලැස්මක් සකස් කිරීමට අවශ්‍ය මානව සම්පත් ව්‍යාපෘතිය සතුව නොමැත. | වත්කම් කළමනාකරණ සැලැස්ම සකස් කිරීමට කටයුතු කළ යුතුය. |
| ඊ) | සමාලෝචිත වර්ෂය තුළ තාක්ෂණික ප්‍රගති වාර්තාව සමග පාරිසරික හා සමාජ අධීක්ෂණ වාර්තාව සකස් කර අරමුදල් සපයන නියෝජිතායතනය වෙත ලබා දී නොතිබුණි. | එය 2023 ජුනි මස අවසන් වන විට තාක්ෂණික වාර්තාව සමඟ AFD වෙත ඉදිරිපත් කෙරේ. | ව්‍යාපෘතියේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා පාරිසරික හා සමාජ නිරීක්ෂණ වාර්තා සකස් කළ යුතුය. |

## 3.5 නිශ්ඵල වියදම්

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| අ) | පැකේජය 01 යටතේ දුම්රිය ප්ලාසා සංවර්ධන ව්‍යාපෘතිය රු.මිලියන 98 ක වටිනාකමකින් නිම කර 2022 වර්ෂයේදී දුම්රිය දෙපාර්තමේන්තුවට භාර දී තිබුණි. කෙසේ වෙතත්, අලුතින් ඉදිකරන ලද ආපනශාලාව නිසි නඩත්තුවක් නොමැතිකම හේතුවෙන් 2023 මැයි 31 දක්වාම පුරප්පාඩුව පැවතිණි. එබැවින් දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ දීර්ඝ කාලීන මෙහෙයුම් සහ නඩත්තු ගිවිසුමක් ඇති කර නොගැනීම නිසා දුම්රිය ප්ලාසා ගොඩනැගිල්ල නිෂ්කාර්ය වත්කමක් ලෙස පැවතිය හැකි බව නිරීක්ෂණය විය. | විසඳුමක් සෙවීමට සහ එහි තිරසාර බව සහතික කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සම්බන්ධ කර ගැනීමට ව්‍යාපෘතිය තීරණය කරන ලදී. | දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ දීර්ඝ කාලීන ගිවිසුමක් ඇති කර ගැනීමට කටයුතු කළ යුතුයි. |
| ආ) | සුරපුර එළිමහන් රංග පීඨයේ ප්‍රතිසංස්කරණය හා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ එළිමහන් රංග පීඨයේ ප්‍රතිසංස්කරණ කටයුතු සියයට 90ක් අවසන් කර තිබුණද ප්‍රධාන උපකරණ සහ භාණ්ඩ (විදුලි පහන්, ආසන) 2023 මැයි 31 දක්වාම සපයා නොතිබීම හේතුවෙන් එම සිනමාහල් භාවිතයට ගත නොහැකි තත්ත්වයක පැවතිණි. එබැවින් ඉදිකිරීම් සඳහා වැය කර තිබූ රු.මිලියන 285.76ක වියදම අනාගතයේදී නිෂ්ඵල වියදමක් විය හැකි බව විගණනයේ අදහස වේ. | AFD විසින් අරමුදල් සැපයීම තාවකාලිකව අත්හිටුවන ලද බැවින්, අවසාන වැඩ කටයුතු සම්පූර්ණ කිරීමට අවශ්‍ය අරමුදල් නොතිබුණි. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව ප්‍රධාන උපකරණ ලබාදීමට උපදෙස් දිය යුතුය. |